## නාරම්මලප්‍රාදේශීය සභාව

---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

අලව්වප්‍රාදේශීය සභාව 2011 අප්‍රේල් 01 දිනසිටඅලව්ව හා නාරම්මලවශයෙන්ප්‍රාදේශීය සභා දෙකක්ලෙසස්ථාපනය කිරීමෙන්පසුවනාරම්මලප්‍රාදේශීය සභාව 2011 අප්‍රේල් 01 දිනසට 2011 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයටඅදාලවමූල්‍ය ප්‍රකාශනපිළියෙල කරතිබුණි

1.1 <u>මූල්‍ය ප්‍රකාශනඉදිරිපත්කිරීම</u>

2011 අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වූකාලපරිච්ඡේදයටඅදාල මූල්‍ය ප්‍රකාශන2012 ජූනි 28 දිනවිගණනයටඉදිරිපත්කරතිබූඅතරඑකිකාලපරිච්ඡේදයටඅදාළ විගණකාධිපති වාර්තාව2012 ඔක්තොබර්11දිනසභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

සභාපතිවරයා වෙත යවන ලද මාගේවාර්තාවේ දක්වා ඇතිඅදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙනවිගණනය සඳහා ඉදිරිපත්කරඇතිනාරම්මලප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්ගිණුම්කාලපරිච්ඡේදයසඳහා වූ මූල්‍ය ප්‍රකාශනපිළිබඳ මතයක්ප්‍රකාශකිරීමට මට නොහැකිය.

1.3 <u>මූල්‍ය ප්‍රකාශනපිළබඳඅදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණඅඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). දඹදෙණිය උපකාර්යාලය මගින්අන්තර්සම්බන්ධිත කුට්ටිගල්නිෂ්පාදනය කිරීමේව්‍යාපෘතියක් පවත්වාගෙන යනුලබනඅතර, සමාලෝචිතගිණුම්කාලපරිච්ඡේදයටඅදාලවනිෂ්පාදන හාලාභාලාභගිණුමක්පිළියෙල කරමෙහෙයුම් ප්‍රතිඵලය ආදායම් හා වියදම් ගිණුමටගැලපීම වෙනුවට කුට්ටිගල්විකුණුම් ආදායම වූ රු.2,535,649 ක වටිනාකම 3.62 අය ශීර්ෂය යටතේගිණුම්ගතකර වියදම් සාමාන්‍ය වැය ශීර්ෂ හරහා ගිණුම්ගතකරතිබුණි.

(ආ). අන්තර්සම්බන්ධිත කුට්ටිගල්ව්‍යාපෘතියටඅදාලවසමාලෝචිතගිණුම්කාලපරිච්ඡේදය අවසානයට ඉතිරිවතිබූඅමුද්‍රව්‍ය තොගය හා නිමි තොගය ගණනය කරගිණුම්ගතකර නොතිබුණි. සමාලෝචිතවර්ෂයටඅදාලභාණ්ඩසමීක්ෂණවාර්තා අනුව එම තොගවටිනාකම රු.1,352,953ක්පමණ විය.

(ඇ). සමාලෝචිතගිණුම්කාලපරිච්ඡේදය අවසානයටආපසු ගෙවිය යුතුකර්මාන්තතැන්පතුගිණුමේ රු.1,507,657ක්වූ සාවද්‍ය හර ශේෂයක්පැනනැගීතිබූඅතර, එය මූල්‍ය ප්‍රකාශන මගින්අනාවරණය කර නොතිබුණි.

(ඈ). වෙනත් ආදායම් (60) ශීර්ෂය යටතේගිණුම්ගත කළයුතු රු.2,917,695 ක්වූ මුද්දර ගාස්තුසහ වරෙන්තු ගාස්තු හා දඩ යටතේගිණුම්ගත කළයුතු රු.2,394,902 ක්වූ උසාවි දඩ වෙනත්ආධාර (70) ශීර්ෂය යටතේගිණුම්ගතකරතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයටඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.42,042,632ක්වූ ගනුදෙනුවිගණනයේදීසතුටුදායක ලෙසසන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනඅනුව 2011අප්‍රේල් 01 දිනසිට දෙසැම්බර් 31 දිනෙන් අවසන්ගිණුම්කාලපරිච්ඡේදය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.71,551 ක් විය.

2.2 මූල්‍ය පාලනය

2011 දෙසැම්බර් 31 දිනටඅවිනිශ්චිතස්වභාවයේ ගිණුම්වල හර ශේෂඑකතුව රු.630,430ක් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින්සමාලෝචිතවර්ෂයටඅදාලවඉදිරිපත්කරතිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනටසමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 3,317 | 3,205 | 112 |
| (ii). | බදුකුලී | 5,687 | 6,467 | 780 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 599 | 517 | 82 |
| (iv). | වෙනත් ආදායම් | 29,393 | 22,822 | 6,571 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත්සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත්බලධාරින්ගෙන්2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුවතිබූමුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 223,833 |

(ii) මුද්දර ගාස්තු 14,693

2.4 අවිධිමත් ගනුදෙනු

2006 අංක 12 දරණ මුද්දර ගාස්තු(විශේෂ විධිවිධාන) පනත යටතේගිවිසුම්අත්සන්කිරීමේදීඒසඳහා වූ මුද්දර ගාස්තුසඳහා මුද්දර නොඅලවා ගාස්තු මුදලින්ලබාගෙන දේශීය ආදායම් කොමසාරිස්ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතුවුවත්, ගිවිසුම් 03 කටඅදාලව රු.23,810 ක්වටිනා මුද්දරගිවිසුම්වල අලවා තිබුණි.

2.5 මානවසම්පත් කළමනාකරණය

සුළු සේවක තනතුරු යටතේඅනුමතකාර්ය මණ්ඩලය 34 ක්වූ අතරඅනුයුක්තසංඛ්‍යාව 34 ක් විය.සමාලෝචිතවර්ෂය අවසානයටඅනියම්/ ආදේශකපදනම යටතේසුළු සේවකයින් 44 දෙනෙකුබඳවාගෙනසහා අරමුදලින්වැටුප් ගෙවා තිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන්කරනු ලැබේ.

(අ). සභාබලප්‍රදේශයේ සුසාන භූමි 76 ක් පැවතිඅතරඒසඳහා සමාලෝචිතවර්ෂය තුලනඩත්තුපිරිවැයක් දරා නොතිබුණි. " සුසානභූමිසභාවට පවරාගෙන නොමැති බවත්ඉදිරියේදී පවරාගැනීමටකටයුතුකරන බවත් " සභාපති 2012 සැප්තැම්බර් මාසයේදී මා වෙත වාර්තා කරතිබුණි.

(ආ). ආයතනයටඅදාලවසංයුක්තසැලැස්මක් හා සමාලෝචිතවර්ෂයේ ක්‍රියාකාරිසැලැස්මක්පිළියෙල කර නොතිබණි.

2.7 අභ්‍යන්තරවිගණනය

සමාලෝචිතවර්ෂයටඅදාළවවිගණන හා කළමනාකරණකමිටුවක්පත්කර නොතිබුඅතරඅභ්‍යන්තරවිගණනවැඩසටහන් යටතේප්‍රමාණවත්අභ්‍යන්තරවිගණනයක්දසිදුව නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන්පද්ධති හා පාලනක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ). මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමණාකරණය

(ඉ) කොන්ත්‍රාත්පරිපාලනය